

" අපේ මේ ආදර බැඳීම අවුරුදු 06 ක ප්‍රතිඵලයක්. මුලින්ම මම තේජාව දුටුවේ මගේ මිතුරියක ගේ නිවසේදී. ඇ මා තෙක ගැටුණු ඇසිල්ලේම සංසාරගත හුරු බවක් මට දැනුණේ. පසුව මගේ සිතට නැගුණු ආදරණීය සිතුවිල්ල ඇයට පැවසුවත්, එක එල්ලේම ඇ මට කැමැත්ත එල කළේ නැහැ.

අමිල ... ඇ මුණ ගැසුණු මතක අවදි කළේ ආදරණීය බවකිනි. එහි ඉතිරිය සම්පූර්ණ කළේ තේජාය.

"මුල්ම මුණ ගැසීම තුළ අමිල ගැන විශේෂත්වයක් ඇති වුණේ නැහැ. ඒත්, බොරු කියන්න ඕනේ නැහැනේ. පොඩි ආකර්ශණයක් ඇති වුනා. කාලයට ඉඩදීලා අමිල ගැන පොඩ්ඩ පොඩ්ඩ සිතන්න ගන්නට පස්සෙ ඔහු තුළ ඇති ගුණාංග අවබෝධ කර ගන්නට හැකියාව ලැබුනා. අද මට හිතෙනවා මාව අමිලටම හමුවෙන්න තිබුන කෙනෙක් කියලා. මම සතුටුවෙනවා එයා මට ලැබුණු එක ගැන. වෙන කෙනෙකුට නොලැබී මටම ලැබීම ගැන..."

- **තේජා කොහොමද ආදරය ගැන හිතන්නේ ?**

"මම හිතන්නේ ආදරය ගොඩාක් අවබෝධයකින් හා කැපවීමකින් කරන්න ඕනෑ පරිත්‍යාගයක් විදිහටයි.

- **අමිල, තේජාගෙන් ඔබ දුටුව ගුණාංග මොනවාද ?**

ඇය හැඩගැසුණු පරිසරය ඇගේ හැසිරීම රටාව විශේෂයෙන්ම මගේ සිත් ගත්තා.

- **ඔය ක්ෂේත්‍රයේ ම කෙනෙක් ජීවන සහකාරිය ලෙස තෝරා නොගත්තේ ඇයි ?**

මගේ ක්ෂේත්‍රයේ ම කෙනෙක් විවාහ වෙනවා කියන අදහසේ මම කොහෙත්ම හිටියේ නැහැ. අනික දෙදෙනාම එකම ක්ෂේත්‍රයේ රැඳී සිටීම මම එතරම් අනුමත කරන දෙයක් නෙමෙයි.

- **ඔබ දෙදෙනා ක්ෂේත්‍ර දෙකක වුවත්, දෙදෙනාටම විවේකය අඩුයි. ඒ තුළ කොහොමද ඔබ දෙදෙනාගේ බැඳීම තහවුරු කරගන්නේ ?.**

"තේජාගේ රාජකාරී සේවා මුර මොන ආකාරයටද යෙදෙන්නේ කියා බලලයි මම මගේ වැඩ කටයුතු සැලසුම් කරන්නේ. ඒ නිසා එය එතරම් ගැටළුවක් නොවෙයි.

- **තේජා රඟපෑම් ක්ෂේත්‍රයට යොමු වනවාට ඔබේ කැමැත්තක් නැද්ද ?**

"ඇත්තටම කැමති නැහැ. ඇගෙත් රඟපෑමේ ආසාවක් නැහැ.

- **අමිල වෙනත් නිළියන් සමග යම් චරිත මවද්දී තේජා ඔබට මොකද හිතෙන්නේ?**

"ඉස්සර නම් බයක් , දුකක් වගේ දැනුනා. ඊර්ෂ්‍යාවක් ඇති වෙනවානේ. එහෙම විශේෂයක් දැන් දැනෙන්නේ නැහැ. මූලිකම දේ අපි අතර ඇති අවබෝධය. මං ගොඩාක්ම බලාපොරොත්තු වෙන්නේ මම ඔහුවත්, ඔහු මාවත් තේරුම් ගැනීම. ඒ දේ අප අතර හොඳින්ම තියෙනවා.ඒ අවබෝධය තුළින් ජීවිතය හඳුනා ගැනීම ඔවුනගේ ඒකායන බලාපොරොත්තුව වී තිබේ. සංසාරගත බැඳීමක ප්‍රාර්ථනාවක්සේ සිතන ඔවුනගේ සෙනෙහසට එය ආශිර්වාදයක් වනු ඇත.



සටහන:- **විපුල් ධර්මප්‍රිය ජයසේකර.**